# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,582- 2008 දෙසැම්බර් මස 26 වැනි සිකුරාදා - 2008.12.26

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1660 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1660 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 1666 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1673 |
| විවිධ දැන්වීම් ... ... ... | — |



**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මීන් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මීන් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2009 ජනවාරි මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 දෙසැම්බර් මස 19 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

1745 - B 079970— 9,125 (2008/12)

# බඩු බාහිරාදිය විකිණීම

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මාවනැල්ල

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාවනැල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් කියනු නොලැබූ සහ නඩු අංක සොයාගත නොහැකි පහත සඳහන් ද්‍රව්‍යයන් 2009.01.24 වැනි දින පෙ. ව. 10.00ට මාවනැල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් කිසියම් ද්‍රව්‍යයන් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුයි.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙර, වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන් හිදී අධිකරණයේ අනුමැතිය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවේලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් බඩු මිලදී ගැනීම සඳහා පැමිණෙන සෑම අයෙක් ම තමාගේ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතුය.

එස්. යූ. බී. කරල්ලියද්ද,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත් -මාවනැල්ල.

2008 නොවැම්බර් මස 21 වැනි දින,
මාවනැල්ල,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු අංකය | නඩු අංකය | වෙන්දේසි කිරීමට ඇති භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 1. | ඒ.7673 | 82 ශ්‍රී 1158 දරන යමහා ආර් එස් 125 යතුරු පැදිය |
| 2. | ඒ.7076 | 92 ශ්‍රී 7015 දරන අබලන් යතුරු පැදිය |
| 3. | ඒ. 8019 | අබලන් කාන්තා පාපැදිය |
| 4. | අංක රහිත | අබලන් නිල්පාට 'හීරෝ' පාපැදිය |
| 5. | අංක රහිත | අබලන් 'ඒසියා බයික්' පාපැදිය |
| 6. | අංක රහිත | අබලන් 'හීරෝ' කලුපාට පාපැදිය |
| 7. | අංක රහිත | අබලන් 'රිලිජන්' වර්ගයේ පාපැදිය |
| 8. | අංක රහිත | අබලන් 'අන්ජායි' වර්ගයේ පාපැදිය |
| 9. | 83932 | ට්‍රේලරය සහිත අබලන් අත් ට්‍රැක්ටරය |
| 10. | අංක රහිත | පාවිච්චි කරන ලද උලු තොගය |
| 11. | අංක රහිත | දිරාපත් වූ වහල ලී (දර මීටර් 01) |
| 12. | අංක රහිත | ලාච්චු 07 ක කොටස් |
| 13. | අංක රහිත | කැබලි වශයෙන් ඇති අල්මාරි 03 ක දැව කොටස් |
| 14. | අංක රහිත | අබලන් දොර උළුවහු (පියන් සහිත) 02 |
| | | අබලන් ජනෙල් (පියන් සහිත) 01 |
| | | අබලන් උළුවහු කඳන් 02 |
| 15. | බී. 784 | අබලන් ගෑස් කුකරයක කොටස් |
| | | අබලන් ශීතකරණයක කොටස් |
| 16. | 11406 | වාහන බැටරි 02 |
| 17. | 11404 | වාහන බැටරි 01 |
| 18. | 11405 | වාහන බැටරි 01 |
| 19. | 11407 | වාහන බැටරි 02 |
| 20. | අංක රහිත | යකඩ ඉනි 02 |
| 21. | 9101 | සවල් 01 |
| 22. | 92553 | සවල් 01 |
| 23. | 7614 | සවල් 01 |
| 24. | 7665 | සවල් 01 |
| 25. | 8335 | සවල් 01 |
| 26. | 6855 | සවල් 01 |
| 27. | 9464 | සවල් 01 |
| 28. | 96720 | ගෑස් සිලින්ඩර් 01 |
| 29. | 89647 | එම 01 |
| 30. | 88991 | එම 01 |
| | එම | ගෑස් ලිප් 01 |
| 31. | 92514 | ගෑස් සිලින්ඩර් 01 |
| | එම | ගෑස් ලිප් 01 |
| 32. | 8391 | ගෑස් සිලින්ඩර් 01 |
| 33. | 202 | ගෑස් සිලින්ඩර් 06 |
| | එම | ගෑස් ලිප් 03 |
| 34. | 97901 | ගෑස් ලිප් 01 |
| 35. | 11239 | ගෑස් සිලින්ඩර් 01 |
| | එම | ගෑස් ලිප් 01 |
| 36. | 17384 | ලොකු ප්ලාස්ටික් බේසම් 01 |
| 37. | අංක රහිත | සිල්වර් බන්දේසි 01 |
| 38. | ඒ. 8741 | එල්. ජී. වර්ගයේ ජංගම දුරකථන 01 |
| 39. | ඒ. 8740 | අඩි 60ක් දිග විදුලි වයර් රෝල් 01 |
| 40. | 17657 | ගෑස් සිලින්ඩර් 01 |
| 41. | 17096 | තැඹිලිපාට ලොකු බාස්කට් 01 |
| 42. | 17777 | ලී ඉරන රවුම් කියත හා තට්ටු බංකු 01 |
| 43. | අංක රහිත | හිස් කුඩා කෑන් තොගය |
| 44. | අංක රහිත | හිස් කුඩා බෝතල් තොගය |
| 45. | අංක රහිත | හිස් කුඩා ලොකු බූලි තොගය |

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

බොරලැස්ගමුව, පැපිලියාන, දෙහිවල පාරේ අංක, 60/11 බී හි පදිංචි පැට්‍රික් මැක්ස්වර්ත් වන මම 1997 සැප්තැම්බර් මස 15 වැනි දින ඩබ්ලිව්. කේ. ඩී. බී. ජයතිලක, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කළ අංක 47 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් කැස්බෑව, බණ්ඩාරගම පාර, ඉසුරුපුර අංක 202/32 හි පදිංචි ෆෙලොමිනා බර්නඩෙත් මැක්ස්වර්ත් යන අය මාගේ ඇටෝර්නි බලකරු ලෙස පත්කළ අතර එය මෙයින් අවලංගු කර අහෝසි කරන බවත්, මින් මතු එකී ඇටෝර්නි බලපත්‍රය කිසිඳු නීත්‍යානුකුල වගකීමක් නොදරණ බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් සාමාන්‍ය ජනතාවටත් දැනුම් දෙමි.

පැට්‍රික් මැක්ස්වර්ත්.

2008 නොවැම්බර් මස 26 වැනි දින.

12-628/1

---

## ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

බොරලැස්ගමුව, පැපිලියාන, දෙහිවල පාරේ අංක, 60/11 බී හි පදිංචි පැට්‍රික් මැක්ස්වර්ත් වන මම, 1999 අගෝස්තු මස 17 වැනි දින ඩබ්ලිව්. කේ. ඩී. බී. ජයතිලක කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කළ අංක 385 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් කැස්බෑව, බණ්ඩාරගම පාර, ඉසුරුපුර අංක 202/32 හි පදිංචි ෆෙලොමිනා බර්නඩෙත් මැක්ස්වර්ත් යන අය මාගේ ඇටෝර්නි බලකරු ලෙස පත්කළ අතර එය මෙයින් අවලංගු කර අහෝසි කරන බවත්, මින් මතු එකී ඇටෝර්නි බලපත්‍රය කිසිඳු නීත්‍යානුකුල වගකීමක් නොදරණ බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, සාමාන්‍ය ජනතාවටත් දැනුම් දෙමි.

පැට්‍රික් මැක්ස්වර්ත්.

2008 නොවැම්බර් මස 26 වැනි දින.

12-628/2

---

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

| | |
|---|---|
| සමාගමේ නම | : ද ඉන්ඩස්ට්‍රියල් රිලේෂන්ස් ඇසෝසියේෂන් ඔෆ් ශ්‍රී ලංකා |
| සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය | : ජී ඒ 2206, 2008.11.17 |
| ලියාපදිංචි ලිපිනය | : කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය, කම්කරු මහලේකම් කාර්යාලය, කොළඹ 05 |

කන්සල්ටන්ස් ඇන්ඩ් කෝපරේට් සෙකට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංකය : 2689618.

12-673/1

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඕස්ට්‍රේලියාවේ එන්. එස්. ඩබ්ලිව්. 2154, කාස්ටල් හිල්, කැන්ස්ඩල් පෙදෙස, 15 (මීට පෙර ඕස්ට්‍රේලියාවේ, ක්වීන්ස් ලැන්ඩ් 4000, බ්‍රිස්බේන්, 307 ක්වීන් ස්ට්‍රීට්හි, ලෙවල් 12 ඒ) දරන තැන, යූ. ඒ. එස්. ෆාමසූටිකල් පුද්ගලික සමාගම වන අපි චිත්‍රාල් ජයන්ත ද සිල්වා අමරතුංග අපේ නීත්‍යානුකූල බලධරයා ලෙස වර්ෂ 2004ක් වූ අගෝස්තු මස 30 වැනි දින ඕස්ට්‍රේලියාවේ සිඩ්නි හි ඉවන් කෙනෙත් මැකින්ටොෂ් මහතා ප්‍රසිද්ධ නොතාරිස් ලෙසින් සාක්ෂි දරනු ලදුව පත් කරනු ලැබූ අතර එම ඇටෝර්නි බලය මෙම ප්‍රකාශනය මගින් වර්ෂ 2008 ක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින සිට ඉල්ලා අස්කරගත් බව දන්වා සිටිමු.

12-642

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නවමග ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2008ක් වූ නොවැම්බර් මස 06 වැනි දින ලියාපදිංචි කරන ලදී.

| | |
|---|---|
| සමාගමේ නම | : නවමග ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමාගමේ අංකය | : පී. වී. 66097 |
| සමාගමේ ලියාපදිංචි කාර්යාලය | : අංක 45, ඇල්ෆ්‍රඩ් හවුස් ගාර්ඩ්න්ස්, කොළඹ 03 |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව,

කෝ-සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

12-640

---

## දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ

| | |
|---|---|
| සමාගමේ නම | : පානම ඩෙයරි ප්‍රොඩක්ට් කම්පැනි ලිමිටඩ් |
| සමාගමේ අංකය | : පී. බී. 3573 |
| සංස්ථාගත කළ දිනය | : 2008.10.31 |
| කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය | : පානම බටහිර, පානම. |

ලේකම්වරුන්.

12-674

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංගොඩ, කැළණිමුල්ල, ගම්සභා පාර, අංක 178/2 ඒ හි පදිංචි අතපත්තු හේවාවසම් ලියනගේ ලීලා රම්‍යලතා නොහොත් ලීලා රම්‍යලතා ජයවර්ධන වන මා අතුරුගිරිය, ඔරුවල දකුණ, අංක 283 හි පදිංචි අතපත්තු හේවාවසම් ලියනගේ නන්දනී මල්ලිකා යන අයට ඩබ්. කේ. ඩී. ජේ. වරාගොඩ ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කළ අංක 2778 සහ 2003.12.02 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය ප්‍රකාරව පවරන ලද ඇටර්නි බලය අද පටන් එනම්, වර්ෂ 2008.11.01 වැනි දින සිට බල රහිත වන බව ශ්‍රී ලංකාවාසී ජනතාවට සහ ජනරජයට දන්වා සිටිමි.

අතපත්තු හේවාවසම් ලියනගේ ලීලා රම්‍යලතා,
නොහොත් ලීලා රම්‍යලතා ජයවර්ධන.

12-660

---

## සීමාසහිත සමාගමක් ස්ථාපිත කිරීම

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 07 දරන ඡේදය අනුව මහජනයා වෙත කරන නිවේදනයයි.

| | |
|---|---|
| සමාගමේ නම | : පී ඇන්ඩ් ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී |
| ලියාපදිංචි අංකය සහ දිනය | : පී. වී. 65966 දිනය : 2008.10.24 |
| ලියාපදිංචි ලිපිනය | : අංක 3/17, කින්සි රෝඩ්, කොළඹ 07. |

සමාගම් ලේකම්.

12-703

---

## ඇටෝර්නි බලකරය අවලංගු කිරීම

ඇමෙරිකා එක්සත් ජනපදයේ නිව්යෝර්ක්, හොලිස් හිල්, 208 වීදියේ 80-20 හි හා කලින් ඇමෙරිකා එක්සත් ජනපදයේ නිව්යෝර්ක් ජැක්සන් හයිට්ස් තට්ටු නිවාස 5, 34 ඇවනිව් 88-11 හි පදිංචි ආර්ය දුලීප් අතුල රණසිංහ, ආර්ය ජවහල්ලාල් ආනන්ද පීරිස් රණසිංහ හා ආර්ය දේවප්‍රිය මංගල රණසිංහ වන අපි, දෙහිවල, කළුබෝවිල, දුටුගැමුණු වීදියේ, අංක 115 හි පදිංචි ආර්ය බුද්දප්‍රිය බන්දුල රණසිංහට අප විසින් දුන් ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 09 කාණ්ඩයේ 134 පත් ඉරුවේ 10591 දින පොත් අංකය යටතේ ලියාපදිංචි කරන ලද 1992 ඔක්තෝබර් මස 02 හා නිව්යෝර්ක් ප්‍රසිද්ධ නොතාරිස් මෙල් ලොට්ෆි ඉදිරිපිට අත්සන් කරන ලද ඇටෝර්නි බලපත්‍රය අප විසින් අවලංගුකර නිශ්ප්‍රභා කරන බව සියලු දෙනාම දැනගැනීම පිණිස මෙයින් ප්‍රකාශකර සිටිමු.

තවද, එකී ඇටෝර්නි බලකරය මත එම ඇටෝර්නි විසින් මින් ඉදිරියට අත්සන් කරනු ලබන කිසිදු ලියකියවිලි සඳහා ද ඔහු විසින් කරනු ලබන කිසිදු ක්‍රියා සඳහා ද අප වගකීමක් භාර නොගන්නා බව ද දන්වා සිටිමු.

ඒ. ඩී. ඒ. රණසිංහ,
ඒ. ජේ. ඒ. පී. රණසිංහ,
ඒ. ඩී. ඇම්. රණසිංහ.

12-675

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

| | |
|---|---|
| සමාගමේ නාමය | : පෝරු (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි අංකය | : පී. වී. 65201 |
| ලියාපදිංචි දිනය | : 2008.08.18 |
| ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය | : අංක 18, ඊ. ඩී. දාබරේ මාවත, නාරාහේන්පිට, කොළඹ 05. |

සමාගම් ලේකම්වරු,
කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්) සමාගම.

12 - 752

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 489 වගන්තිය යටතේ විදේශීය සමාගමක ශාඛාවක් සංස්ථාපිත කිරීමයි

| | |
|---|---|
| සමාගමේ නම | : ෆරාබ් කම්පනි |
| ලියාපදිංචි අංකය | : FC 1042 |
| දිනය | : 2008.11.13 |
| ලියාපදිංචි ලිපිනය | : ෆරාබ් කම්පනි, අංක 51/2, වෝඩ් පෙදෙස, කොළඹ 07. |

බිස්නස්මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,

අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02.

12-690

---

## සමාගම් නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2008 නොවැම්බර් මස 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි තම සමාගම් නාමය වෙනස් කළ බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | |
|---|---|
| සමාගමේ පෙර නාමය | : මැක්ලරන්ස් වෙයාහවුසිං ලිමිටඩ් |
| සමාගමේ අංකය | : PB 133 |
| ලියාපදිංචි ලිපිනය | : අංක 123, බෞද්ධාලෝක මාවත, කොළඹ 04 |
| සමාගමේ නව නාමය | : එම්. ජී. ලොජිස්ටික්ස් ලිමිටඩ්. |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මැක්ලරන්ස් හෝල්ඩින්ග්ස් ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

12 - 753

**සමාගම් ලියාපදිංචි කිරීමේ සාමාන්‍ය දැන්වීම**

පහත විස්තර කර ඇති පරිදි 2007 අංක 07 දරන නව සමාගම් පනතේ, 9 වැනි ඡේදයේ, අනු ඡේද 01 ට අනුව පහත සඳහන් සමාගම් දෙක නීත්‍යානුකූල සමාගම් ලෙස ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

| *සමාගම් නාමය* | *සමාගම් අංකය/දිනය* | *ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය* |
|---|---|---|
| 1. බී. ආර්. ප්‍රනාන්දු රෙසිඩන්සීස් පෞද්ගලික සමාගම | පීවී 65916<br>2008 ඔක්තෝබර් මස 20 | අංක M-02, නිවාසිපුර, කොටුගොඩ. |
| 2. සදර්න් ස්පෙයාස් ඉන්ටර්නැෂනල් පෞද්ගලික සමාගම | පීවී 66298<br>2008 නොවැම්බර් මස 21 | කලාප 51, බියගම නිදහස් වෙළඳ කලාපය, වල්ගම, මල්වාන. |

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සමාගම් ලේකම්වරු,
මැන්සෙක් සර්විසස් පෞද්ගලික සමාගම - පීවී 6.

අංක 6A, 6C, ඩේසි විලා මාවත,
බම්බලපිටිය, කොළඹ 04,
දුරකථන අංක : 2597911/2597910.

12-672

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී (ගාල්ල නගර ශාඛාව)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර

බලයලත් මානක එම්. ඒ. සෙල්වින් ප්‍රේමරත්න විසින් 1984 දෙසැම්බර් මස 06 වැනි දින සාදන ලද අංක 2243 දරන පිඹුර පරිදි දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පෙ පත්තුවේ, කරගොඩ, නබඩාව සහ යටලමත්ත ග්‍රාමයන් තුළ පිහිටි මහහෙන නමින් හැඳින්වෙන කරගොඩ වතුයායේ ලොට් 1, ලොට් 1ඒ හි ලොට් 1 කියන ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් බී 1 දරන අක්කර දොළහයි, රූඩ් දෙකක් (අ. 12, රූ. 2, පර්. 0) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සියලුදේත් සමඟ වේ.

2. (I) බලයලත් මානක එච්. එල්. ආර්. ජයසුන්දර විසින් 2001 ජූලි මස 20 වැනි දින හා 21 වැනි දිනවල සාදන අංක 933B හි දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පෙ පත්තුවේ, යක්කලමුල්ල දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසයේ, කරගොඩ, නබඩාව සහ යටමලගල ග්‍රාමයන් තුළ පිහිටි (කරගොඩ වතුයායේ බෙදන ලද කොටසක් වන) මහහේන කියන ඉඩමේ ලොට් 01 දරන ඉඩම් කොටසේ නැවත බෙදීමක් වන ලොට් 1 ඒ ලෙස බෙදා වෙන් කරන ලද,

අක්කර දොළහයි, රූඩ් දෙකක් (අ. 12, රූ. 2, පර්. 0) හෝ හෙක්ටයාර් 05.060 විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි සහ සියලුදේත් සමඟ වේ.

2. (II) බලයලත් මානක එච්. එල්. ආර්. ජයසුන්දර විසින් 2001 මාර්තු මස 27 වැනි දින සහ 28 වැනි දිනවල සාදන අංක 933 ඒ දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පෙ පත්තුවේ, යක්කලමුල්ල දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසයේ, කරගොඩ සහ නබඩාව ග්‍රාමයන් හි පිහිටි කරගොඩ වතුයායේ මහහේන කියන ලොට් බී දරන ඉඩම,

අක්කර හයයි, පර්චස් විසිපහක් (අ. 6, රූ. 0, පර්. 25) හෝ හෙක්ටයාර් 02.492 විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි සහ සියලුදේත් සමඟ වේ.

දොඹගොඩ ලියනගේ රංජිත් වසන්ත ණයකරු හැටියට ද, ඔහු විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ, වර්ෂ 2009 ක් වූ ජනවාරි මස 16 වැනි දින ප.ව. 1.00 ට එම දේපළ පිහිටි ස්ථානයන් හි දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2007.08.03 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2007.08.08 දිවයින, ද අයිලන්ඩ්, සහ තිනකරන් පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2008.12.26 දින *රජයේ ගැසට් පත්‍රයද*, දිවයින සහ ද අයිලන්ඩ් පුවත් පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම*.- යක්කලමුල්ල නගරයේ සිට අකුරැස්ස දක්වා ඇති මහාමාර්ගය ඔස්සේ සැතපුම් 2 1/4 පමණ ගොස් විවනේගොඩ තැපැල් කාර්යාලය පිහිටි මංසන්දියට පිවිසිය යුතුය. එතැන් සිට වම් පසින් ඇති එල්ආර්සී ඉඩම හරහා මොරකැටිය වලට යන පාරේ සැතපුම් 1 1/4 ක් පමණ ඉදිරියට ගියවිට අදාළ දේපළ වම්පසින් හමුවේ.

*ගෙවීමේ ක්‍රමය* :- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය :

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) ;
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකක් (01%) ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%) ;
4. නොතාරිස් ගාස්තුව රු. 2,000 ;
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500 ;

6. වෙන්දේසිය සඳහා වැයකරන ලද සියළුම ප්‍රචාරක වියදම් ;
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ ගාල්ල නගර ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :

එල්. බී. සේනානායක - සාම විනිසුරු,
බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු සහ
උසාවි කොමසාරිස්,
කොළඹ වාණිජ මහාධිකරණය සහ
දිසා අධිකරණය බලයලත්
ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
රාජ්‍ය බැංකු හා වාණිජ බැංකු,
අංක 99 උසාවි පාර, කොළඹ 12.
දුරකථන සහ ෆැක්ස් අංකය : 2445393.

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.
ගාල්ල නගර ශාඛාව, 130 මහවීදිය,
ගාල්ල.
දුරකථන අංක : 091-2234356, 091-2235786, 091-2234469.
ෆැක්ස් අංකය : 091-2234467.

12-711

---

**ඩී එෆ් සී සී බැංකුව**
(කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වැනි වගන්තිය යටතේ විකිණීම

**වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම අංක 1308 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ දේවමැදි උඩුකහ කෝරළයේ මොරගොල්ල ග්‍රාමයේ සහ දඹදෙනි හත්පත්තුවේ රැකොපත්තු කෝරළයේ උහුමීය සහ පඹේ යන ග්‍රාමයන්හි පිහිටි බලයලත් මිනින්දෝරු එස්. කේ. තැන්නේගෙදර මහතා විසින් සකසන ලද 2007 මාර්තු මස 23 වැනි දින දාතමින් යුතු අංක 1208A/07 දරන පිඹුරු පතෙහි ලොට් අංක 01 ලෙස සලකුණු කර ඇති ක්ලෝවිස් වත්ත ලෙස හැඳින්වෙන ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : අක් 10, රූඩ් 02, පර්. 8.3

එහි පිහිටි ගස් වැල්, ගොඩනැගිල්ල සහ අන් සියලු දෙය ද සමග එකී ඉඩමට මායිම්වූ මීගමුව නගරයට ප්‍රවේශ වන අඩි 20 පළල පොදු මාර්ගය පරිහරණය කිරීම සහ නඩත්තු කිරීමේ බලය සහිතව කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එෆ්. ජේ. සී. ඩබ්ලිව්. පෙරේරා මහතා විසින් ලියා සහතික කරන ලද, 2007 අප්‍රේල් මස 05 වැනි දින දාතමින් යුතු අංක 1308 සහ 1310 යන උකස්කරයන් ප්‍රකාර කුරුණෑගල පිහිටි 'පසල්කා ට්‍රේඩ් සෙන්ටර්' යන නමින් හැඳින්වෙන ව්‍යාපාරයේ එකම හිමිකරුවූ කුරුණෑගල පදිංචි නවින්ද්‍ර ගලප්පත්ති විසින් ඩී එෆ් සී සී බැංකුවට උකස් කරන ලදුව. ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩීඑෆ්සීසී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 ජනවාරි මස 12 වෙනි දින (සඳුදා) පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

එදිනම සවස 2.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**අංක 1310 දරණ උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ තිරගන්දහයේ කෝරළේ, කුරුණෑගල නගර සභා සීමාවේ පිහිටි වෙලන්ගොල්ල ග්‍රාමයේ පිහිටි වෙලන්ගොල්ල වත්ත යන නමින් ද හැඳින්වෙන බලයලත් මිනින්දෝරු එස්. ජී. රණසිංහ මහතා විසින් සකසන ලද, 2003 ජූනි මස 25 වැනි දින දාතමින් යුතු අංක 1625/A දරන පිඹුරු පතෙහි ලොට් අංක 105 ලෙස සලකුණු කර ඇති ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : අක් 0, රූඩ්. 0, පර්. 10.65

එහි පිහිටි ගස්වැල්, වැව්ලි, ගොඩනැගිලි සහ අන් සියළු දෙයද සහිතව අංක 1525 දරන පිඹුරු පතෙහි ලොට් 4 ලෙස සහ අංක 1625A දරන පිඹුරු පතෙහි ලොට් අංක 110, 111, 112, 113 සහ 114 ලෙස සලකුණු කර ඇති පොදු ප්‍රවේශ මාර්ග භාවිතා කිරීමේ සහ නඩත්තු කිරීමේ අයිතියද සමග.

*ගෙවීමේ ක්‍රමය*.- මිල තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්) ;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර) ;
4. රු. 33,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ;
5. ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තුව රු. 500.00 ;
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.00.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න :
දුරකථන අංක : 011-2440366/77.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001:2000 සහතිකය ලත්,
ශ්‍රී ලංකාවේ පිළිගත්, පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ එජන්තවරු.

*නගර කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් : 011-2588176,
ඊමේල් : schokman@samera1892.com.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර,
දුරකථන : 081-2227593
දුරකථන/ෆැක්ස් : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk
වෙබ් අඩවිය : www.schokmandsamerawickreme.com.

12-737

## රුහුණ සංවර්ධන බැංකුව - වැලිගම ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපළ 2009.01.13 දින පෙ. ව. 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

*අංක 5466 උකස්කරය යටතේ*

01. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළෙයේ පැනැටියන පිහිටි ගොරොක්ගහවිලහේන පී. පී. 10741 සඳහන් අංක 1, 2, 3, 4, 5, 6 හා 7 දරන ඉඩමෙන් බෙදා වෙන් කළ අංක 01 ඒ දරන අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් දහසයයි දශම පහක් (අක්. 01, රූඩ් 01 පර්. 16.5) ක් විශාල ඉඩමේ සියළු ගහකොළ, පළතුරු සමග බිමද,

02. ඉහත කී පැනැටියන පිහිටි ගොරොක්ගහවිලහේන පීපී 10741 සඳහන් අංක 1, 2,3, 4, 5. 6 හා 7 දරන ඉඩමෙන් බෙදා වෙන් කළ අංක 02 දරන අක්කර එකයි, පර්චස් විසි එකක් (අක්. 01 රූඩ් 00 පර්. 21)ක් විශාල ඉඩමේ සියළු ගහකොළ පළතුරු සමග බිම ද,

03. ඉහත කී පැනැටියන පිහිටි ගොරොක්ගහවිලහේන පීපී 10741 සඳහන් අංක 1, 2, 3, 4, 5, 6 හා 7 දරන ඉඩමෙන් බෙදා වන් කළ අංක 04 දරන අක්කර එකයි, රූඩ් දෙකයි පර්චස් තිස්හතක් (අක්. 01, රූඩ් 02 පර්. 37) ක් විශාල ඉඩමේ සියලු ගහකොළ, පළතුරු සමග බිම ද වේ.

04. ඉහත කී පැනැටියන පිහිටි ගොරොක්ගහවිලහේන පී. පී. 10741 සඳහන් අංක 1, 2, 3, 4, 5, 6 සහ 7 දරන ඉඩමෙන් බෙදා වෙන් කළ අංක 06 දරන අක්කර එකයි, රූඩ් තුනයි, පර්චස් විසිහතරක් (අක්. 01 රූඩ් 03 පර්. 24) ක් විශාල ඉඩමේ සියලු ගහකොළ පළතුරු සමග බිම ද,

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

*අංක 5486 උකස්කරය යටතේ*

ඉහත කී පැනැටියන පිහිටි පී. පී. 10741 දරන සැලැස්මේ සඳහන් අංක 08 දරන ගොරොක්ගහවිලහේන නැමැති ඉඩම නැවත බෙදා වෙන්කර සාදන ලද අංක 4428 සැලැස්ම ප්‍රකාර අක්කර එකයි, රූඩ් තුනයි, පර්චස් තිස්හතක් (අක්. 01, රූඩ් 03, පර්. 37) ක් විශාල ඉඩමේ සියලු ගහකොළ, පළතුරු සමග බිම ද, එහි පිහි සියලුම ගොඩනැගිලි ද වේ.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

*අංක 8392 උකස්කරය යටතේ*

01. ඉහත කී පැනැටියන පිහිටි ගොරොක්ගහවිලහේන පී. පී. 10741 සඳහන් අංක 1, 2, 3, 4, 5, 6 හා 7 දරන ඉඩමෙන් බෙදා වෙන් කළ අංක 01 ඒ දරන අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් දහසයයි දශම පහක් (අක්. 01, රූ. 01, පර්. 16.5) ක් විශාල ඉඩමේ සියලු ගහකොළ, පළතුරු සමග බිම සහ එහි පිහිටි ගොඩනැගිලි ද වේ.

02. ඉහත කී පැනැටියන පිහිටි ගොරොක්ගහවිලහේන පී. පී. 10741 සඳහන් අංක 1, 2, 3, 4, 5, 6 හා 07 දරන ඉඩමෙන් බෙදා වෙන් කළ අංක 02 දරන අක්කර එකයි පර්චස් විසි එකක් (අක්. 01 රූ. 0 පර්. 21) ඉඩමේ බිම සහ එහි පිහිටි සියළු වැව්ලි හා ගොඩනැගිලි ද

03. ඉහත කී පැනැටියන පිහිටි ගොරොක්ගහවිලහේන පී. පී. 10741 සඳහන් අංක 1, 2, 3, 4, 5, 6 හා 07 දරන ඉඩමෙන් බෙදා වෙන් කළ අංක 04 දරන අක්කර එකයි පර්චස් රූඩ් දෙකයි, පර්චස් තිස්හතක් (අක්. 01 රූඩ් 02 පර්. 37) ක් විශාල ඉඩමේ සියළු වැව්ලි සමග බිමද, සියළු ගොඩනැගිලි ද වේ.

04. ඉහත කී පැනැටියන පිහිටි ගොරොක්ගහවිලහේන පී. පී. 10741 සඳහන් අංක 1, 2, 3, 4, 5, 6 හා 07 දරන ඉඩමෙන් බෙදා වෙන් කළ අංක 06 දරන අක්කර එකයි රූඩ් තුනයි, පර්චස් විසිහතරක් (අක්. 01 රූඩ් 03 පර්. 24) ක් විශාල ඉඩමේ සියළු ගහකොළ, පළතුරු සමග බිමද, එහි පිහිටි සියළු ගොඩනැගිලි ද වේ.

05. ඉහත කී පැනැටියන පිහිටි පී. පී. 10741 සඳහන් අංක 08 දරන ගොරොක්ගහවිලහේන ඉඩම නැවත බෙදා වෙක්කළ අංක 4428 සැළැස්ම ප්‍රකාර අක්කර එකයි, රූඩ් තුනයි, පර්චස් තිස්හතක් (අක් 01 රූඩ් 03 පර්චස් 37) විශාල ඉඩමේ සියළු ගහකොළ, පළතුරු සමග බිමද, එහි පිහිටි සියළු ගොඩනැගිලි ද වේ.

වැඩි විස්තර සඳහා 2006.06.02 දින රජයේ ගැසට් පත්‍රය ද, 2006.08.25 දින දිනමිණ, තිනකරන් හා දී අයිලන්ඩ් යන පුවත්පත්වලද පළ කර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*- වැලිගම පැනැටියන මාර්ගයේ පැනැටියන කණිටු විදුහල අසලින් වම්පසට වැටී ඇති සද්ධාතිස්ස මාවතේ කි. මී. 1/2ක් ගියවිට පාරේ දකුණු පස මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය :

01. ගැණුම් මිළෙන් 25%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් 2 1/2%ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදලද වේ.

ගැණුම් මිළෙන් ඉතිරි 75%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ අංක 382 ඒ, දරන ස්ථානයේ පිහිටි රුහුනු සංවර්ධන බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරී මහතාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30 ක් ඇතුළත අදාළ මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිළෙන් ගෙවා ඇති 25%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532- 2226208, 2226209.

ජී. පී. ආනන්ද,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත, වල්ගම මාතර.
දුරකථන අංකය : 041-2228731.

12-650

### මහජන බැංකුව - වැලිගම ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2009.01.16 දින පෙ. ව. 11.00 ට මෙහි පහත විස්තර වන දේපල, දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උකස් කර ඇති දේපල පිළිබඳ විස්තරය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, මෝදර, දොඩන්දූව පිහිටි යෝනුන්ගෙවත්ත නමැති ඉඩමේ ලොට් 26න් බෙදා වෙන් කළ ලොට් 01 දරන පර්චස් දහයක් (අ. 0 රූ. 0 පර්. 10) විශාල ඉඩම එහි පිහිටි සියලු වැවිලි ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

වැඩි විස්තර සඳහා 2008.09.05 දින රජයේ *ගැසට් පත්‍රයේ* ද 2008.11.03 දින දිනමිණ පුවත්පතේ ද පළකර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම*.- ගාල්ල කොළඹ පාරේ, කුමාරකන්ද හන්දියෙන් වැටී ඇති ඇල්පිටිය පාරේ මීටර් 150ක් පමණ ගොස් දකුණු පසට වැටී ඇති තාර පාරේ මීටර් 100ක් පමණ ඉදිරියට ගියවිට පාරේ දකුණුපසට ඇති පස් පාරේ මීටර් 50ක් පමණ ගියවිට පාරේ වම්පස මෙම දේපල හමු වේ.

*ගෙවීමේ ක්‍රමය*.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

01. ගැණුම් මිළෙන් 10%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිළෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් ගැණුම් මිළෙන් 2 1/2%ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම හා වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිළෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත මාතර, පිට්ටනිය පාරේ, අංක 38/1 ඒ දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව, ප්‍රාදේශිය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතුය.

දුරකථන අංක : 041 -2222792, 2222822 හා 2224773
ෆැක්ස් අංකය : 041-2222688

හිමිකම් ඔප්පු හා වෙනත් ආදල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිළෙන් ගෙවා ඇති 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාමවිනිසුරු)
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමාසරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර.
දුරකථන අංක 041-2228731, 071-4438516

12-732

---

### ඩී. එෆ්. සී. සී. බැංකුව
### (පෙර ලංකා සංවර්ධන මුදල් සංස්ථාව)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය යටතේ වෙන්දේසි කිරීම

**උකස් බැඳුම්කර අංක 3086 උකස් කරන ලද දේපල**

බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණය අක්. 0 රූඩ් 0 පර්චස් දහයයි.

ඉහත සඳහන් ඉඩම පහත සඳහන් ඉඩමෙන් බෙදා වෙන් කරන ලද කොටසකි. උතුරු මැද පලාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම් පලාතේ කඩවත් කෝරළේ අලුත් කඩවන තුලාන මැදවච්චියේ පිහිටි ටී. පී. 205474 හි පෙන්වා ඇති ඉඩම් කොටස ප්‍රමාණය අක්. 0 රූඩ් 1 පර්චස් 0 (රූඩ් එකයි)

මෑතකදී කරන ලද මැනුමක් අනුව ඉහත සඳහන් ඉඩම පහත සඳහන් ආකාරයට විස්තර කර ඇත. බලයලත් මිනින්දෝරු කේ. වී. සමතපාල විසින් මැන සාදන ලද ලොට් අංක 1 පිඹුරු අංක 4757 හා 2006 සැප්තැම්බර් මස 17 වැනි දින ටී. පී. 205747 ලකුණු කර ඇති කොටස ප්‍රමාණය අක්. 0 රූඩ් 0 පර්. 9.38 වේ. පර්චස් නමයයි දශම තුනයි අටයි. (එහි තුළ ඇති ගොඩනැගිලි සහ අනිකුත් සියලු දේ සමග වේ.

"සම්පත් හෝටලය සහ බේකරිය" යන නාම විලාශයෙන් සහ අභිධානයෙන් තනි අයිති ව්‍යාපාරයක් පවත්වාගෙන යන මැදවච්චියේ කුඩා ආරච්චිගේ ඇලිස් නෝනා විසින් ඩී. එෆ්. සී. සී. බැංකුවට උකස් කරන ලද දේපල ඩී. එෆ්. සී. සී. බැංකුව මගින් මා වෙත පවරන ලද බලතල අනුව වර්ෂ 2009ක් වූ ජනවාරි මස 13 දින ප. ව. 2.30 ට ආරම්භ කර එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීමේ ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය :

01. ගැණුම් මිළෙන් සියයට දහයක් (10%)ක්,
02. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිළෙන් සියයට දෙකයි දශම පහක් (2.5%)ක්,
04. නොතාරිස් ගාස්තු රු. 2,000,
05. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,
06. සියලු ප්‍රචාරක වියදම්,
07. ගැණුම් මිළෙන් ඉතිරි සියයට අනූව (90%) ශ්‍රී ලංකා ජනරජයේ හෝ වෙනත් බලධාරීන් විසින් නියෝග කරන ලද ව්‍යවස්ථාපිත බද්ද තීරු බද්ධ හෝ වෙනත් බදු ගෙවීම් කළ දින සිට දින 30 ඇතුලත දී ගෙවිය යුතුය.

වැඩිවිස්තර සඳහා ඩී. එෆ්. සී. සී. බැංකුවේ නීති නිලධාරී අමතන්න. දුරකථන අංක : 011-2442442.

ගාමිණී බී. එස්. දියාව,
වෙන්දේසිකරු තක්සේරුකරු සහ බ්‍රෝකර්වරු.

අංක 247, ප්‍රීතිපුර පාර,
පල්ලිය වත්ත,
හැඳල වත්තල.
දුරකථන අංකය : 077-7281723.

12-654/1

## පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පි එල් සී

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 ජනවාරි 15 වැනි දින ප. ව. 3.00 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුනනු ලැබේ.

මධ්‍යම පලාතේ මහනුවර දිස්ත්‍රික්කයේ ගඟවත්ත කෝරලේ මහනුවර මහ නගර සභා සීමා තුළ පේරාදෙණිය පාරේ පිහිටි පේරාදෙණිය පාර වර්තමානයේ සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ වරිපනම් අංක 412/1 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු එස් ඒ දිසානායක විසින් සාදන ලද අංක 365 සහ 2006/07/29 දින 2006/09/12 දින මායිම් මැන සහතික කරන ලද) දරන සැලැස්මේ නිරූපිත ලොට් අංක 2 වශයෙන් ලකුණු කොට සීමා නිර්ණය කල ඇති (බලයලත් මිනින්දෝරු පී ආර් ඩබ්ලිව් එම් වීරකෝන් විසින් සාදන ලද අංක 5284 සහ 1991.05.01 දින දරන සැලැස්මේ නිරූපිත ලොට් අංක 2 දරන ඉඩම් කැබැල්ලේ නැවත මැනීමක් වන) ඉඩම ප්‍රමානය අ.0 රූ.0 පර්.13.4 කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වූ ද ෆොන්සේකා විසින් සහතික කරන ලද අංක 254 සහ 2006.10.17 වැනි දින දරන උකස්කර මගින් අබ්දුල් රහීම් මොහොමඩ් ඉර්ෂාඩ් උකස් කරන ලද දේපළ

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.12.12 වැනි දින ලක්බිම, සුඩර් ඔලි, ඩේලි නිවුස් පුවත් පත් සහ 2008.12.19 වන දින ගැසට් පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.*- මහනුවර නගර මධ්‍යයේ සිට සිරිමාවෝ බණ්ඩාරනායක මාවත *නොහොත්* පේරාදෙණිය පාරේ කිලෝමීටර් 1.5 ගිය විට ඉන්ෆෝමැටික් පුහුණු ආයතනය අසලින් දකුණට හැරී වාහන ගමන් කල හැකි තාර පාරේ සහ කොන්ක්‍රීට් පාරේ මීටර් 100 ක් පමණ ගිය විට අදාල දේපල වම් පසට පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසාන වූ විගස ගැනුම්කරු එවලෙම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය :

1. ගැනුම් මුදලින් 10% ද ;
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% සහ වැට් බද්ද ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් 2 1/2% ද (සියයට දෙකහමාරක් පමණ) ;
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුලත ගැනුම් මිලේ පරිශේෂය වන 90%ක මුදල බැංකුවට ගෙවිය යුතුය.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම හා වෙනත් අදාළ තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු නීති පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී එල් සී ප්‍රධාන කාර්යාලය අංක 450 ගාලු පාර කොළඹ 03. දුරකථන අංක : 2565573/2565565

රංජිත එස් මහානාම,
සාම විනිසුරු (මුලු දිවයිනටම),
උසාවි කොමසාරිස්
තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

ආර් එස් එම් ඔක්ෂන්ස්,
මහනාම ඩ්‍රයිව්,
නො 474, පිටකෝට්ටේ,
කෝට්ටේ,
දුරකථන අංකය : 2863121.

12-698/1

## පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 ජනවාරි 16 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුනනු ලැබේ :

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුන, පානදුර තල්පිට දෙබැද්ද, තල්පිටියෙහි පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු ලක්ෂ්මන් ගුණසේකර විසින් සාදන ලද අංක 1782 සහ 2001/06/23 වැනි දින දරන සැලැස්මේ නිරූපිත ලොට් 3B2A දරන කහටගහවත්ත නැමැති බිම් කැබැල්ල සහ එහි ගස්කොලන් සහ සියලු දේත් සමග වේ.

ඉඩමේ ප්‍රමාණය අක්. 0, රූඩ් 0, පර්. 20 9.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඩී. එස්. ෆොන්සේකා විසින් සහතික කරන ලද අංක 2409 සහ 2007.06.06 වැනි දින දරන උකස්කර මගින් දොන් දුමින්ද දේවප්‍රිය අධිකාරම් සහ රත්නවීර පටබැඳිගේ සුසි සීලව වන ඔටෝ විෂන් එන්ටප්‍රයිසස් හි හවුල්කරුවන් උකස් කරන ලද දේපළ

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.12.18 වැනි දින ලක්බිම, සුඩර් ඔලි, ඩේලි නිව්ස් පුවත් පත් සහ 2008.12.18 වැනි දින ගැසට් පත් ද බලන්න.

*දේපලට පිවිසෙන මාර්ගය.*- කොළඹ කොටුවේ සිට ගාලු පාරේ 30 වන කිලෝමීටර් කණුව පසුකර මීටර් 60ක් පමණ ගිය විට දකුණු අත පැත්තේ මෙම පාරට මුහුණලා ගුරු පාරේ කෙලවර විකිණීමට නියමිත අදාල ඉඩම පිහිටා ඇත.

